(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 77.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2011 මාර්තු මස 09 වැනි බදාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0315/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) අයිෆා උළෙල කොළඹදී පැවැත්වීමට ශ්‍රී ලංකාව එකඟතාවකට පැමිණියේ කවදාද;

(ii) එම උළෙල සඳහා කරන ලද වියදම් සඳහා ගෙවීම් කරන පාර්ශ්වය කවරෙක්ද;

(iii) ඒ සඳහා මුදල් ලැබුනු දිනය කවරේද;

(iv) ඉහත සඳහන් ආකාරයට මුදල් ගෙවීම සිදු කරනු නොලබන්නේ නම්, අදාළ වියදම පියවනු ලබන්නේ කවරෙක්ද;

(v) උළෙල සඳහා වැය වූ මුළු වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අයිෆා උළෙල තුළින් ලබා ගැනීමට අපේක්ෂා කරන ලද ප්‍රතිලාභ කවරේද;

(ii) එවැනි ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිවූයේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0410/'10

2.

ගරු දිළුම් අමුණුගම මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2004 වර්ෂයේ රාජ්‍ය සේවයේ සිටි සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2010 වන විට රාජ්‍ය සේවයේ සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) 2004 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය සේවයට බඳවා ගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තවදුරටත් මෙම සේවක සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ වැඩි කිරීමට ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0529/'10

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නැගෙනහිර පළාතේ, තිරුක්කොන්ඩියාඩුමඩු - ජයන්තිපුර මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, එම ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0545/'10

4.

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 1948 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඔලිම්පික් තරඟ සඳහා ඉදිරිපත් වූ බව එතුමා දන්නෙහිද?

(ආ) ඔලිම්පික් තරඟ සඳහා ඉදිරිපත් වූ එම ක්‍රීඩක නාම ලේඛනය සහ එම ක්‍රීඩකයින් විසින් ලබාගත් ජයග්‍රහණත්, ඊට අදාළ වර්ෂයනුත් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉදිරි ඔලිම්පික් ක්‍රීඩා උළෙල පවත්වනු ලබන ස්ථානය සහ වර්ෂය කවරේද;

(ii) ඒ සඳහා අප රට වෙනුවෙන් ක්‍රීඩකයින් සහභාගි වන්නේද;

(iii) ඒ සම්බන්ධයෙන් දියත් කර ඇති වැඩ පිළිවෙළ කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0624/'10

5\.

ගරු ආර්. යෝගරාජන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කොළඹ 12, හුසේනියා මාවත, අංක 45 හි පිහිටි හමීඩ් අල් හුසේනියා විද්‍යාලයෙහි බරපතළ ගුරු හිඟයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පාසල සඳහා අනුමත වී ඇති එක් එක් විෂය සඳහා වූ සිංහල සහ දෙමළ මාධ්‍ය ගුරුවරු සංඛ්‍යාව කවරේද;

(ii) එක් එක් විෂය සඳහා එක් එක් මාධ්‍යයෙන් සිටින ගුරුවරු සංඛ්‍යාව කවරේද;

(iii) එක් එක් විෂය සඳහා එක් එක් මාධ්‍යයෙන් පවතින ගුරු හිඟය කොපමණද;

(iv) ඉහත සඳහන් ගුරු හිඟයට පිළියම් යෙදීම පිණිස ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) එම ක්‍රියාමාර්ග ගනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) රාජකීය, ආනන්ද සහ නාලන්ද විද්‍යාලවල ගුරු අතිරික්තයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ඈ) (i) ඉහත (ඇ) කොටසෙහි සඳහන් පාසල්වල සිටින අතිරික්ත ගුරුවරු සංඛ්‍යාව එක් එක් මාධ්‍ය අනුව සහ එක් එක් විෂය අනුව කොපමණද;

(ii) පවතින පුරප්පාඩු පිරවීම සඳහා මෙම අතිරික්ත ගුරුවරු හමීඩ් අල් හුසේනියා විද්‍යාලයට මාරු කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0642/'10

6\.

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මෙම වර්ෂය තුළදී රැකියා ලබා දීමට අපේක්ෂිත රැකියා විරහිත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා දැන්වීම් ප්‍රසිද්ධකර සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබේද;

(iii) එම බඳවා ගැනීම් ආරම්භ කරන හා අවසන් කරන දිනයන් කවරේද;

(iv) ඉහත රැකියා ලබාදීමේ වැඩ පිළිවෙළ වෙනුවෙන් අයවැය ඇස්තමේන්තුව මඟින් වෙන්කිරීමට අපේක්ෂිත මුදල කොපමණද:

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0708/'10

7\.

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2005 සිට 2010 අගෝස්තු දක්වා කාල සීමාවේදී කොරියානු රජය මඟින් ශ්‍රී ලංකාවට ලබා දුන් විදේශ රැකියා සංඛ්‍යාව එක් එක් වර්ෂය සඳහා, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රැකියා අවස්ථාවක් ලබා ගැනීමට පුද්ගලයකු විසින් අනුගමනය කළයුතු ක්‍රියා පටිපාටිය කවරේද;

(iii) එම රැකියා සඳහා පිටත්වූ පුද්ගලයින්ගේ සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) කොරියානු රැකියාවක් සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා දැනට විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ලියාපදිංචි වී සිටින සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ලියාපදිංචි වූ කොරියානු රැකියා අපේක්ෂකයෙකුගේ ලියාපදිංචිය වලංගුවන කාල සීමාව කවරේද;

(ii) ඉහත ලියාපදිංචිය අවලංගු වූ රැකියා අපේක්ෂකයෙකු කොරියාවේ රැකියාවක් ලබා ගැනීම සඳහා නැවත අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග කවරේද;

(iii) ඉදිරියේදී මේ සඳහා පුද්ගලයින් තෝරා ගැනීමේදී දැනට විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ලියාපදිංචිවී සිටින රැකියා අපේක්ෂකයින් හට ප්‍රමුඛත්වය ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0731/'10

8.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා දේශීය ආදායම් සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ බදු නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය 2006 වර්ෂයේ පැවැත්වූ බවත්;

(ii) එම විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් 16,000 ක් අතරින්, 1000 ක පමණ පිරිසක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවූ බවත්:

(iii) එම පිරිසෙන් 550 දෙනෙකුට 2007 වර්ෂයේ අප්‍රියෙල් 01 වන දින සිට පත්වීම් ප්‍රදානය කළ බවත්;

(iv) එම පත්වීම්ලාභීන් අතර මෙම විභාගයට අදාළව 2006 වර්ෂයේ නිකුත් කළ ගැසට් නිවේදනයේ සඳහන් දිනට උපාධි සහතිකය නොමැති අය සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) බදු නිලධාරීන් ලෙස ඉහත පත්වීම් ලැබූ එක් එක් අපේක්ෂකයාගේ නම, ලිපිනය සහ ලබා ගත් ලකුණු ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2006.12.08 දින පෙරවරු 9.30 ට සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි ජා-ඇල, නැගෙනහිර තුඩැල්ල, අංක 76/සී හි පදිංචි ඩබ්ලිව්. ඒ. එස්. එම්. සෝයිස් මහත්මිය එම විභාගයේ දී හා සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0780/'10

9.

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වන විට විදේශ රටවල සේවයේ නියුතු විවාහක ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ මෙරට සිටින දරුවන් සංඛ්‍යාව කොපමණද?

(ii) එම දරු දැරියන්ගේ ආරක්ෂාව හා සුභ සාධනය වෙනුවෙන් රජය ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් කවරේද?

(iii) එවැනි වැඩසටහන් සඳහා රජය වර්ෂයකට වැය කරනු ලබන මුදල් ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0317/'10

10.

ගරු රවී කරුණානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයට ලැබිය යුතු මුළු ණය මුදලේ ප්‍රමාණය කොපමණද;

(ii) ලංකා විදුලිබල මණ්ඩලයට වැඩිම මුදලක් ගෙවිය යුතු ණය ගැතියන් දස දෙනාගේ නම් කවරේද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලයේ අධික ණය බර හේතුවෙන් එය ලබාගත් ණය මුදල් සඳහා ගෙවිය යුතු පොළී ප්‍රමාණය කොපමණද;

(iv) මෙම තත්ත්වයෙන් මිදීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(v) ලංකා විදුලිබල මණ්ඩලය තම ණය හිමියන්ට ගෙවිය යුතු මුදල් ප්‍රමාණය කොපමණද;

(vi) ලංකා විදුලිබල මණ්ඩලය වැඩිම මුදලක් ගෙවිය යුතු ණය හිමියන් දස දෙනාගේ නම් කවරේද;

(vii) පසුගිය වර්ෂ හය තුළ එම මුදල් ලැබිය යුතුව තිබූ දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) විදුලි මිල ඉහල යැමට හේතුවී ඇත්තේ ලංකා විදුලිබල මණ්ඩලයේ අකාර්යක්ෂමතාව සහ එය විසින් ලබාගෙන ඇති අධික ණය බව සත්‍යයක්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ලංකා විදුලිබල මණ්ඩලයට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රකාශිත කොන්දේසි කවරේද;

(ii) ලංකා විදුලි බල මණ්ඩලය එම කොන්දේසි ඉටුකිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0575/'10

11.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට එක් එක් දිස්ත්‍රික්කයේ රජයේ පාසල්වල සේවය කරන ස්වේච්ඡා ගුරුවරුන්ගේ සංඛ්‍යාව පාසල් වර්ගීකරණය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ස්වේච්ඡා ගුරුවරුන් ස්ථිර කිරීම සඳහා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iii) පසුගිය අයවැය යටතේ ඒ සඳහා මුදල් වෙන් කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 50/2008 හි 2 කොටසේ VI වැනි වගන්තියට යටත් ස්වේච්ඡා ගුරුවරුන් මේ වන තෙක් ස්ථිර සේවයේ පිහිටුවා නොමැති බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඔවුන් සේවයේ ස්ථිර කිරීම සම්බන්ධයෙන් ගන්නා වූ ක්‍රියා මාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0781/'10

12.

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට නැගෙනහිර පළාත තුළ පදිංචි, ත්‍රිවිධ හමුදා, පොලිසිය, පොලිස් විශේෂ කාර්ය බළකාය සහ සිවිල් ආරක්ෂක සේවයේ යෙදී සිටියදී තම ස්වාමි පුරුෂයන් අහිමිවූ කාන්තාවන් සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වැන්දඹු කාන්තාවන් වෙනුවෙන් රජය ක්‍රියාත්මක කර ඇති සුභ සාධන සේවාවන් කවරේද;

(iii) ඔවුන්ගේ දරුවන් සම්බන්ධයෙන් රජය ක්‍රියාත්මක කර ඇති සුභ සාධන සේවාවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0379/'10

13.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වන විට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහ පළාත් සභා මන්ත්‍රීවරුන්ට ලබා දී ඇති ඇමති ආරක්ෂක අංශයේ හෝ පොලීසියේ නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඇමති ආරක්ෂක අංශ නිලධාරීන් යොදවා ඇත්තේ වෙන කවුරුන් වෙනුවෙන්ද;

(iii) එසේ ලබාදී ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා හැර අනෙකුත් අයට මේ වන විට ලබාදී ඇති ඇමති ආරක්ෂක අංශ නිලධාරීන්ගේ නම් ලැයිස්තුවක් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) මේ වන විට ඇමති ආරක්ෂක අංශයේ හෝ පොලිසියේ ආරක්ෂාව තවමත් ලැබෙන පරාජිත අපේක්ෂකයින් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් කවරේද;

(ii) ඔවුන් සඳහා යොදවා ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද; සහ ඔවුන් කවර ප්‍රදේශවලින්ද;

(iii) එලෙස යොදවා ගැනීම සඳහා යොදාගත් නිර්ණායක කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) ශ්‍රේෂ්ඨාධිකරණයේ, මහාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිසුරුවන් සඳහා ලබා දී ඇති ඇමති ආරක්ෂක අංශයේ, විනිසුරුවන්ගේ ආරක්ෂක අංශයේ හෝ පොලිසියේ නිලධාරී සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0724/'10

14.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සිටින සමෘද්ධි ණය ලබාගත් සංඛ්‍යාව;

(ii) එම ණය ලබා දී ඇති පොලී අනුපාතිකය;

(iii) ණය ලබා දීමේ දී අනුගමනය කරන ක්‍රියා පිළිවෙත;

(iv) මේ වන විට අය කර ගැනීමට ඇති මුදල් ප්‍රමාණය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ණය ලබාගත් සමෘද්ධිලාභීන්ගෙන් ණය අයකර ගැනීමේදී නිලධාරීන් අත්තනෝමතික ලෙස කටයුතු කරන බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේ නම්, ඒ පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0782/'10

15.

ගරු අනෝමා ගමගේ මහත්මිය,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ පදිංචි උපතින්ම ආබාධිත සහ විවිධ අනතුරු හා රෝගාබාධවලට ලක්ව ආබාධිත තත්ත්වයට පත්ව සිටින පුද්ගලයන්ගේ සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ආබාධිත පුද්ගලයන් සඳහා රජය මගින් සලසනු ලබන සහන සේවාවන් කවරේද;

(iii) ඒ සඳහා රජය වාර්ෂිකව වැය කරන මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— දේශීය ආදායම් (සංශෝධන),— 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— එකතු කළ අගය මත බදු (සංශෝධන),— 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන),— 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

4.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආර්ථික සේවා ගාස්තු (සංශෝධන),— 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

5.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ),— ආණ්ඩුව විසින් එකතු කරගන්නා ලද සියලු මුද්දර ගාස්තු පළාත් සභාවලට මාරු කිරීම සඳහා විධිවිධාන සැළැස්වීම සඳහා ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැළැස්වීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි.

7.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු (ඉවත් කිරීමේ),— 2006 අංක 51 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු පනත ඉවත් කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

8.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) (සංශෝධන),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

9.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු (සංශෝධන),— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

10.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන),— 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

11.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— බදු අභියාචනා කොමිසම,— බදු අභියාචනා කොමිසම පිහිටුවීම සඳහාත්, එම කොමිසමට අදාල බලතල නියම කිරීමටත්, එම අභියාචනා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය සඳහන් කිරීමටත්, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

12.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විදුලි සංදේශ බදු,— 2011 ජනවාරි මස 1 වැනි දින සිට ආරම්භවන පරිදි යම් විදුලි සංදේශ සේවාවක් ලබා ගන්නා තැනැත්තන් මත විදුලි සංදේශ බද්දක් පැනවීම සඳහා ද; 2004 අංක 11 දරන මුදල් පනතේ II වැනි කොටස සංශෝධනය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

13.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු,— ශ්‍රී ලංකාවෙන් පිටත දී ආරම්භ වන ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සෑම භාණ්ඩයක් මත ම වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් පැනවීමට සහ ඒ බද්ද එකතු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, 2002 අංක 11 දරන මුදල් පනතේ I වන කොටස සංශෝධනය කිරීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

14.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— හරබදු (ඉවත් කිරීමේ),— 2002 අංක 16 දරන හරබදු පනත ඉවත් කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

15.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මුදල් (සංශෝධන),— 2006 අංක 11 දරන මුදල් පනත, 2005 අංක 5 දරන මුදල් පනත, 2003 අංක 25 දරන මුදල් පනත සහ 1995 අංක 16 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

## **යෝජනා පිළිබඳ දැනුම්දීම**

16.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

17.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 7.30 දක්වා විය යුතුය. අ. භා. 7.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

18.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2011 මාර්තු මස 22 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය.

19.

ගරු කනක හේරත් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2011 මාර්තු මස 03 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*2.

ආහාර (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2010 සැප්තැම්බර් 20 දිනැති අංක 1672/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2010 ඔක්තෝබර් 29 දිනැති අංක 1677/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2010 දෙසැම්බර් 09 දිනැති අංක 1683/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— රේගු ආඥා පනත යටතේ යෝජනාව,— (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2011.02.23 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2010 නොවැම්බර් 22 දිනැති අංක 1681/13 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*9.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*10.

සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— වී අලෙවි මණ්ඩලය පනත යටතේ යෝජනාව,— 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩලය පනතේ 10 වැනි වගන්තිය සහ 4 වැනි වගන්තියේ (6) වැනි ඡේදය සමග කියවිය යුතු, 62 වැනි වගන්තිය යටතේ සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදනු ලදුව 2010 දෙසැම්බර් 18 දිනැති අංක 1684/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.24 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*11.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*12.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*13.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2011 ජනවාරි මස 04) [1]

*14.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2011 ජනවාරි මස 04) [1]

15.

මහේෂ්වරි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.